# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1319 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 14/08/2024<br>පැය 1225 |

## මාධ්‍ය නිවේදනය

**දක්ෂිණ අධිවේගී මාර්ගයේ මාරක රිය අනතුරක් - ඇල්පිටිය පොලිස් වසම.**

2024.08.14 වන අද දින උදෑසන කාලයේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ මත්තල දෙස සිට කොට්ටාව දෙසට ගමන් ගත් වෑන් රථයක් ඇල්පිටිය පොලිස් වසමේදී වෑන් රථයේ පිටුපස ටයරයක හුලං බැසීම හේතුවෙන් මැද ආරක්ෂිත වැටේ වැදී පෙරළීමෙන් අනතුරක් සිදු වී ඇත. අනතුරින් වෑන් රථයේ ගමන් ගත් කුඩා දරුවන් තිදෙනෙකු තුවාල ලබා ඇල්පිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු දැරියක් මියගොස් ඇත.

**මියගිය දැරිය වයස අවුරුදු 02 මාස 02 ක් වූ කතරගම, වැඩිහිටිකන්ද ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෙම වෑන් රථයේ කුඩා දරුවන් ඇතුළු වැඩිහිටියන් 12 දෙනෙකු ගමන්කර ඇත. ඇල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**